මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 15.10.2024

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

ජනාධිපතිතුමනි,

**මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව ලැබී ඇති විශේෂ බලතල**

ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ ඔබතුමාට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සුබ පැතුම් පිරිනමනු ලබයි.

මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2024 සැප්තැම්බර් 26 දිනැති අංක 2403/47 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ (40 පරිච්ඡේදය) පළ කරන ලද නියෝග පිළිබඳව කොමිෂන් සභාවේ අදහස් ඔබතුමා වෙත ඉදිරිපත් කරමු. එම නියෝගය මගින් 2024 සැප්තැම්බර් 27 දින සිට මාසයක කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයකම මහජන සාමය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම සාමාජිකයන් කැඳවා ඇත.

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 (ඇ) වගන්තිය ප්‍රකාරව, ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව රජයක් විසින් පරිපාලන ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත බලතල පැවරී ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මහජන ආරක්ෂක ආඥා පනතේ 12(1) වගන්තිය වෙත ඔබතුමාගේ අවධානය යොමු කර සිටී.

කිසියම් ප්‍රදේශයක මහජන ආරක්ෂාවට තර්ජනයක් වන තත්ත්වයක් මතුව ඇති හෝ මතුවීමට ආසන්නව පවතින අවස්ථාවක සහ එවැනි තත්ත්වයකට මුහුණ දීමට එම ප්‍රදේශයේ යොදවා ඇති පොලීසිය ප්‍රමාණවත් නොවන බවට ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක එම ප්‍රදේශයේ (අවධාරණය ඇතුළත් කර ඇත) මහජන සාමය පවත්වා ගැනීම සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝග මගින්, සියලුම හමුදාවන් හෝ ඕනෑම සන්නද්ධ හමුදාවක සාමාජිකයින් හෝ ඕනෑම සන්නද්ධ හමුදාවක් හෝ කැඳවීමට ජනාධිපතිවරයාට හැකිය.


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail — sechrcsl@gmail.com

විශේෂයෙන් "මහජන ආරක්ෂාවට තර්ජනයක් වන තත්ත්වයන් මතුව ඇති විට සහ "එවැනි තත්ත්වයකට මුහුණ දීම සඳහා පොලිසිය ප්‍රමාණවත් නොවේ" යන මතය ගොඩනැගීම සම්බන්ධයෙන්, ඉහත සඳහන් විධිවිධානයේ ඇතුළත් දැඩි නිර්ණායක පිළිබඳව සලකා බලන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉල්ලා සිටී. විශේෂයෙන්, මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ සන්නද්ධ හමුදාවන් යෙදවීමට අවශ්‍ය වන්නේ, මහජන ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයේ සුවිශේෂී තත්ත්වයන් මතුව ඇති බවත්, රටේ මහජන සාමය පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා පොලිසියට හැකියාවක් නොමැති බවත් යන මතයට පැමිනීමට ජනාධිපතිතුමාට සිදුවූ අවස්ථාවකදීය. එවැනි නිර්ණායක මගින් මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයක සුවිශේෂී ස්වභාවය පිළිබඳව පෙන්වා දෙන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අවධාරණය කරනු ලබයි. පසුගිය වසර කිහිපය තුළ එවැනි නියෝග ලබා දීම සාමාන්‍ය දෙයක් වුවද, එවැනි නියෝග නිකුත් කල යුත්තේ මහජන ආරක්ෂාවට තර්ජනයක් වන සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් බවත් , එවැනි තත්ත්වයකට මුහුණදීම සඳහා පොලිස් විශේෂ කාර්ය බළකාය ඇතුලු ශ්‍රී ලංකා පොලිසිය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී පමණක් බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහසයි. අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන් සහ ප්‍රමිතීන්වලට අනුව, සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සන්නද්ධ හමුදා යෙදවීම රජයක් විසින් කළ යුතුව පවතී. නිදසුනක් වශයෙන්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කරන ආකාරය අධීක්ෂණය කිරීම සඳහා පත්කර ඇති බලයලත් සම්මුතිගත ආයතන වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව, පොලිසියේ කාර්යයන් ඉටු කිරීම සඳහා සන්නද්ධ හමුදා යෙදවීම පිළිබඳව සිය බරපතල කනස්සල්ල පළ කර ඇත. ඒ ආකාරයෙන් සන්නද්ධ හමුදා යෙදවීමෙන් රටක මානව හිමිකම් ආරක්ෂාව කෙරෙහි ඇති විය හැකි සෘණාත්මක බලපෑම පිළිබඳව වඩාත් පැහැදිලි වේ.

එබැවින් එවැනි නියෝග නිකුත් කිරීම සම්බන්ධයෙන් නැවත වරක් සලකා බලන ලෙසටත්, මහජන ආරක්ෂාව සහතික කිරීම සඳහා සිවිල් බලධාරීන්, එනම් ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි විශ්වාසය තැබීමේ ක්‍රියාමාර්ගය ප්‍රතිෂ්ඨාපනය කරන ලෙසටත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකාව මේ වන විට පාර්ලිමේන්තු මැතිවරණයක් කැඳවා ඇති නිසාත්, මෙම අවස්ථාවේදී මැතිවරණ කාලසීමාවක් යටතේ පවතින නිසාත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104D වගන්තිය කෙරෙහි ද ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරන ලෙසට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉල්ලා සිටී. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම කෙරෙහි අගතියක් ඇති කළ හැකි යම් ක්‍රියා හෝ සිද්ධීන් වැළැක්වීම හෝ පාලනය කිරීම සඳහා සන්නද්ධ හමුදා යෙදවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට එම විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව වෙත බලය පැවරේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් එවැනි නිර්දේශයක් ලබාදී නොමැති අවස්ථාවක මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ මේ අවස්ථාවේ නියෝගයක් ලබාදීම සුදුසුද යන්න පිළිබඳවද සලකා බලන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

අවසාන වශයෙන් මහජන ආරක්ෂක ආඥා පනතේ 21(4) වගන්තිය පිළිබඳව, එනම් "12 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයක් පාර්ලිමේන්තු යෝජනාවක් මගින් සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට හැකිය......." යන්න පිළිබඳව සලකා බලන ලෙස ද ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු. මහජන අරක්ෂක

ආඥා පනතේ 12 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන ඕනෑම නියෝගයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණයක් සිදුකළ යුතු බව මෙම විධිවිධානය මඟින් සහතික කරනු ලැබේ.

එබැවින් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවක මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වගන්තිය යටතේ එවැනි නියෝගයක් නිකුත් කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව සලකා බලන ලෙසද ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

මෙම කාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ පිළිබඳව සලකා බැලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය ස්තුතිය ඔබතුමා වෙත පළ කර සිටී. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි බලපාන්න වූ පරිපාලනමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාව සිය අඛණ්ඩ උපදෙස් සහ සහය ලබාදීම සඳහා කැපවී කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමු.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : ගරු නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.